**<u>හදිසි මරණ පරීක්ෂකවරුන් පිළිබඳ (පත් කිරීමේ යෝජනා ක්‍රමය, විනය ක්‍රියා පටිපාටිය, පත් කිරීම අවලංගු කිරීම සහ වගකීම් සහ කාර්යය භාරය) ස්ථාවර කාර්යය සංග්‍රහය</u>**

1. **<u>නීතිමය රාමුව.</u>**

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XXX පරිච්ඡේදය යටතේ මරණ පරීක්ෂණ සිදු කිරීම සඳහා එකී පනතේ 108 වැනි වගන්තියෙන් අධිකරණ විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල යටතේ, හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම, පත්වීම් අවලංගු කිරීම සිදු කිරීමේ ක්‍රියාවලිය සහ පත් කරනු ලබන හදිසි මරණ පරීක්ෂකවරුන් පනතේ විධිවිධාන අනුව සිය සේවය ලබා දීමේ දී ඔවුන්ගේ වගකීම සහ කාර්යය භාරය මෙම සංග්‍රහය යටතේ දක්වා ඇත.

2. **<u>පත්වීමේ ස්වභාවය.</u>**

**2.1.** හදිසි මරණ පරීක්ෂක තනතුර රජයේ වැටුප් ලබන ස්ථිර තනතුරක් නොවන අතර මෙම තනතුර මහජනතාවට සේවයක් ලබා දෙනු ලබන ගරු තනතුරකි. කෙසේ වුවද හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ලබන මරණ පරීක්ෂණ සඳහා ආයතන සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව (අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 03/2019 සහ එහි සංශෝධනයන්ට අනුව) අදාළ මහාධිකරණය හරහා ගෙවීම් සිදු කරනු ලැබේ.

**2.2.** හදිසි මරණ පරීක්ෂකවරුන්ට රජයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ වැටුප් ලබන වෙනත් කිසිදු තනතුරක සේවය කිරීමට නොහැකි ය. හැකි සෑම අවස්ථාවක දී ම තම සේවය ලබා දිය යුතු ය.

**2.3.** හදිසි මරණ පරීක්ෂකවරුන් තම සේවය ඉටු කිරීම සඳහා හෝ ඉටු කළ රාජකාරියක් වෙනුවෙන් කිසිදු බාහිර පාර්ශ්වයකින් කිසිදු ප්‍රතිලාභයක් හෝ මුදලක් ලබා ගැනීමේ හිමිකමක් නොමැත.

**2.4.** හදිසි මරණ පරීක්ෂක තනතුරට පත් වී, එය ක්‍රියාත්මක වන දින සිට වසර තුනක්(03) සම්පූර්ණ වන දිනය හෝ වයස අවුරුදු (හැත්තෑව) 70 සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය තෙක් වලංගු වේ.

3. **<u>පත් කිරීමේ මූලික සුදුසුකම්.</u>**

**3.1.** <u>යම් අයදුම්කරුවකු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙකු ලෙස පත් කරනු ලැබීමට පහත සුදුසු කම් සපුරාලිය යුතු වේ</u>.

**3.1.1.** ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

**3.1.2.** වයස අවුරුදු විසි හත (27)ට නො අඩු හා අවුරුදු හැට පහ (65)ට නොවැඩි විය යුතු ය.

**3.1.3.** මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි අයෙකු වීම.

**3.1.4.** පත්වීම් අපේක්ෂා කරන හදිසි මරණ පරීක්ෂක බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසමක වසරක ස්ථිර පදිංචි කරුවෙකු විය යුතු ය.

**3.1.5.** අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී එකවර විෂයන් 03කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව හැර) සමත් වීම (තාක්ෂණ දැනුම සහ අ.පො.ස.(උ.පෙළ) ජීව විද්‍යා විෂයන් 3ක් සමත් වූ අයදුම් කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ).

**3.1.6.** අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංගීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබෙන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**3.1.7.** රාජකාරි ඉටුකිරිමට අපේක්ෂිත භාෂා මාධ්‍යයේ ප්‍රවීණයකු වීම.

**3.1.8.** (203 වන අධිකාරය වූ ) මෝටර් වාහන පනතේ, කලින් කලට, වෙනස් කරනු ලැබිය හැකි පරිදි වූ රුපියල් දසදහසක් නො ඉක්ම වූ දඩයක් නියම කරනු ලැබිය හැකි වරදකට හැර වෙනත් යම් අපරාධ චෝදනාවකට අධිකරණයක දී වරදකරුවකු වී නොතිබීම.

**3.1.9.** අධිකරණ විෂය භාර අමාත්‍යවරයකු විසින් පත් කරනු ලැබූ කිසියම් තනතුරකින් පහ කරනු නො ලැබූ අයකු වීම.

**3.1.10.** 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ පත් කරනු ලබන උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන් තමා හෝ කලත්‍රයා සේවයේ යෙදීම මෙම තනතුරට පත්වීමේදී නුසුදුසු කමක් ලෙස සලකනු ලැබේ.

**3.2.** <u>**රෝහල් සඳහා හදිසි මරණ පරීක්ෂකවරුන් ලෙස පත් කරනු ලැබීම සඳහා හදිසි මරණ පරීක්ෂකවරයකු පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතු ය.**</u>

**3.2.1.** රෝහල අයත් දිස්ත්‍රික්කයේ කොට්ඨාසයක හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් අවම වසර තුනක (03) අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**3.2.2.** පත්කිරීමට සලකනු ලබන අවස්ථාවේ දී නිලධාරියා විනය පරීක්ෂණයකට මුහුණ දෙමින් නොසිටින සහ විනය පරීක්ෂණයකින් හෝ අපරාධ නඩුවකින් වරදකරුවෙකු නො විය යුතු ය.

**3.2.3.** වෛද්‍ය වාර්තා කියවා තේරුම්ගත හැකි ඉංග්‍රීසි දැනුමක් සතුවිය යුතු බැවින් අ.පො.ස සාමාන්‍යපෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

**3.2.4.** හදිසි මරණ පරික්ෂක ඩිප්ලෝමාධාරියෙකු විය යුතු ය.

**3.2.5.** අධිකරණ අමාත්‍යාංශය / සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළු සඳහා සහභාගි වූ අයෙකු විය යුතු ය.

## 4. <u>තනතුරට පත්කිරීමේ / දීර්ඝ කිරීමේ ක්‍රමවේදය.</u>

### 4.1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පත්වීම් සඳහා

**4.1.1.** පුරප්පාඩු හදිසි මරණ පරීක්ෂක බල ප්‍රදේශයන් සඳහා ගැසට් පත්‍රයේ හෝ අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරනු ලබන දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීම.

**4.1.2.** ඒ අනුව, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනීම, සාමාන්‍ය නීතිය සහ ජීවවිද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් පවතින දැනුම පරීක්ෂා කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම.

**4.1.3.** ලිඛිත පරීක්ෂණයේ දී සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත්වීම් ලබා දෙනු ලැබේ.

### 4.2. රෝහල් පත්වීම් සඳහා

**4.2.1.** පුරප්පාඩු පවතින රෝහල් අමාත්‍යාංශ වෙබ් අඩවියේ පල කරනු ලබන දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවීම.

**4.2.2.** ඒ අනුව, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පිළිබඳ දැනුම සහ වෛද්‍ය වාර්තා කියවා තේරුම් ගැනිමේ දැනුම සලකා බැලීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීම.

4.2.3. ලිඛිත පරීක්ෂණයේ දී සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජන කිරීමෙන් අනතුරුව ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත්වීම් ලබා දෙනු ලැබේ.

4.3. දීර්ඝ කිරීමේ ක්‍රමවේදය

4.3.1. ඉහත 4.1 සහ 4.2 යටතේ වන පත්වීම් හි වසර තුනක කාලය ඉක්ම යාමට මාස තුනකට පෙර අධ්‍යාපන සහ භාෂා සුදුසුකම් හැර අනෙකුත් මූලික සුදුසුකම් නොවෙනස් ව පවතින බවට සහතික වන දිවුරුම් ප්‍රකාශයක් සහිතව සේවා දීර්ඝය සඳහා ලිඛිතව ඉල්ලීම කළ යුතු ය.

4.3.2. ඉල්ලීම්කරුගේ යහපත් සෞඛ්‍ය තත්වය පිළිබඳව රජයේ රෝහලකින් ලබා ගත් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

4.3.3. එහි දී, එතෙක් සම්පූර්ණ කල සේවා කාලය තුළ දී යහපත් හැසිරීම, කාර්යක්ෂමතාව, අවංක බව, විනය, හදිසි මරණ පරීෂකවරුන් වෙනුවෙන් අධිකරණ අමාත්‍යංශය විසින් හෝ එකී අමාත්‍යංශයේ හෝ සෞඛ්‍ය අමාත්‍යංශයේ සහභාගිත්වයෙන් පවත්වන ලද පුහුණු කිරීම් සහ වැඩමුළු වලට සහභාගි වීම් ආදී සියලු කරුණු සලකා බලනු ලැබේ.

5. <u>වගකීම් හා කාර්ය භාරය.</u>

5.1. සම්භාවනීය වූත්, ඉතාමත් වගකීමකින් යුක්ත වූත් හදිසි මරණ පරීක්ෂක තනතුරු සඳහා අධිකරණ කටයුතු විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් තැනැත්තන් පත් කරනු ලබන්නේ හදිසි මරණයක් සිදුවූ අවස්ථාවක දී ඒ පිළිබඳ කඩිනම් පරීක්ෂණයක් පවත්වා අධිකරණයට ආධාර වීම මෙන්ම හදිසි මරණයට භාජන වන පුද්ගලයින්ගේ ඥාතීන්ට එම මෘත ශරීරය ඉක්මනින් ගෞරවාන්විතව භාරදීම හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් සිදු කරනු ඇතැයි යන විශ්වාසය පෙරදැරි කරගෙන වේ.

5.2. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXX පරිච්ඡේදයෙහි විධි විධාන සහ අමාත්‍යංශය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ ලිඛිත විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු ය.

5.3. අනලස්ව, සාධාරණව සහ අපක්ෂපාතීව, තියුණු පරීක්ෂණයකින් යුක්තව සිය නිර්දේශ අදාළ අධිකරණයන් වෙත වාර්තා කිරීමට හදිසි මරණ පරීක්ෂකවරුන් නෛතිකව බැඳී සිටියි.

5.4. හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් තොරතුරු වාර්තා කිරීම හා විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ඔබ තුළ ඊට අදාල නීති රීති පිළිබඳව පුළුල් අවබෝධයක් තිබිය යුතු ය.

5.5. සෑම හදිසි මරණ පරීක්ෂකවරයෙකුටම සිය සේවා කාලය තුළ දී මෙම අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද වලංගු පත්වීම් ලිපියක් හා නිල හැඳුනුම්පතක් තිබිය යුතු ය.

5.6. සෑම හදිසි මරණ පරීක්ෂකයෙකුට ම ලියාපදිංචි අනුක්‍රමික අංකයක් ලබා දෙන අතර සිය රාජකාරි කටයුතු වල දී අනිවාර්යෙන්ම එම අංකය සඳහන් කළ යුතු ය. සිය නිල මුද්‍රාවෙහිද එම අංකය ඇතුළත් කලයුතු අතර නිල මුද්‍රාව සඳහා රාජ්‍ය ලංඡනය හෝ කිසිදු අධිකරණ ලාංඡනයක් භාවිත නො කළ යුතු වේ.

5.7. හදිසි මරණ පරීක්ෂකවරයෙකු තමා එකී ධූරයේ සේවා ඉටුකරන බවට දැනුම් දීම සඳහා සිය කාර්යාලයේ සහ පදිංචි ස්ථානයේ "හදිසි මරණ පරීක්ෂක" යන නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සිදු කළ හැකි ය.

5.8. පත්වීම දී ඇති කාල සීමාව ඉක්මවීමෙන් පසුව රාජකාරි කටයුතු වල නිරත විය නොහැක. සේවා දීර්ඝ කිරීමට අවශ්‍ය වේ නම් පත්වීම් කාල සීමාව ඉක්මවීමට මාස තුනකට (මාස 3) පෙර ලිඛිත ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**5.9.** තනතුර අවසන් වීමෙන් අනතුරුව හෝ නිසි ලෙස සේවය දීර්ඝ කිරීමක් ලබා ගැනීමකින් තොරව තවදුරටත් හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි කටයුතු කිරීම ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 168 වන වගන්ති යටතේ වන දඬුවම් ලැබිය යුතු වරදක් වන බැවින් එකී තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සිදුකොට, ඒ සඳහා දඬුවම් පැමිණවිය හැකි ය.

**5.10.** හදිසි මරණ පරීක්ෂකවරුන් නීත්‍යානුකූල හේතු රහිතව මෘත ශරීර මරණයට පත් වූවන්ගේ ඥාතීන්ට බාරදීම ප්‍රමාද නොකළ යුතු ය. මරණය සම්බන්ධයෙන් මරණයට අදාළ චාරිත්‍රානුකූල කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි (මරණය සිදු වී පැය 24 කට අඩු කාල සීමාවක්) තුළ දී මරණ පරීක්ෂක තැනගේ සහතිකය (බී 18) නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

**5.11.** මරණ පරීක්ෂණයක් පවත්වන හදිසි මරණ පරීක්ෂකවරයාගේ කාර්යය, අපරාධයක් හෝ වරදක් විභාග කිරීම නොවන අතර මරණයට හේතුව හා එය සිදු වූ ආකාරය පිළිබඳව අධිකරණයට කරුණු වාර්තා කිරීම වේ. ඒ අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXX පරිච්ඡේදය යටතේ වන කාර්යය සහ බලතල පිළිබඳ විධිවිධාන යටතේ සෑම අවස්ථාවක දී ම සිදු කිරීමට වගකීමෙන් යුතුව කටයුතු සිදු කල යුතු වේ.

**5.12.** හදිසි මරණ පරීක්ෂකගේ කොට්ඨාසය තුළ මරණයක් පිළිබඳව තොරතුරක් ලැබුණු වහාම මිය ගිය තැනැත්තාගේ සිරුර තිබෙන ස්ථානයට වහාම ගොස් පරීක්ෂණය පැවැත්වීම අත්‍යාවශ්‍ය වේ. සිරුර වෙනත් ස්ථානයකට රැගෙන එන ලෙසට ඥාතීන්ට දැන්වීම කිසිසේත්ම සිදු නො කළ යුතු ය.

**5.13.** බී 18 ආකෘතියේ මරණයට හේතුව සඳහන් කිරීමේ දී පශ්චාත් මරණ පරීක්ෂණයක් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වා ඇත්නම් ඔහු මරණයට හේතුව දක්වා ඇති පරිදිම හා එම භාෂාවෙන්ම ලිවීමට කටයුතු කළ යුතු ය.

**5.14.** පශ්චාත් මරණ පරීක්ෂණයක් නො පවත්වා හදිසි මරණ පරීක්ෂක විසින් දෘශ්‍යමාන මරණයට හේතුව සඳහන් කරන අවස්ථාවක හදිසි මරණ පරීක්ෂකවරුන් පුහුණු කර ඇති පරිදි (WHO Format) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති Ia- ආසන්නතම හේතුව, Ib, Ic - කලින් තිබූ හේතු හෝ පාදක වූ හේතූන් හා II - ආධාරක හේතූන් යන ආකාරයට B-18 ෆෝරමයේ සඳහන් කළ යුතු ය.

**5.15.** සෑම මරණ පරීක්ෂණයක්ම අවසන් කළ වහාම අදාළ වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා මෙයට අමුණා ඇති නිශ්චිත ආකෘතිය පිටපත් තුනකින් (03) යුක්තව පිළියෙල කළ යුතු ය. පළමුවැනි පිටපත මරණ පරීක්ෂණ වාර්තාව සමඟ මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කළ යුතු ය. දෙවන පිටපත අධිකරණ අමාත්‍යාංශයේ හදිසි මරණ පරීක්ෂකයින් සම්බන්ධයෙන් රාජකාරි සිදු කරන අතිරේක ලේකම් වෙත එවිය යුතු ය. තෙවන පිටපත හදිසි මරණ පරීක්ෂකවරයා ගොනු කර තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

**5.16.** මරණ පරීක්ෂණ වාර්තා සුරක්ෂිතව තබා ගැනීම මරණ පරීක්ෂකවරයකුගේ වගකීම වන අතර තනතුරෙන් ඉල්ලා අස්වීමක්, සේවය අවසන්වීමක් සිදුවන අවස්ථාවේ දී එම තනතුරට පත් වන අනුප්‍රාප්තික හදිසි මරණ පරීක්ෂකවරයාට අදාළ සියලු ලේඛනයන් ගොනුකර විධිමත්ව හා ලිඛිතව භාර දිය යුතු ය. එසේ භාර දෙන ලද ලේඛනයන්හි තොරතුරු නිශ්චිත ආකෘති පත්‍රය ප්‍රකාරව සම්පූර්ණ කර දින 15ක් තුළ දී අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දිය යුතු ය.

**5.17.** යම් මරණයක් සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කළ යුතු ද යන්න තීරණය කිරීමේ වගකීම හදිසි මරණ පරීක්ෂකවරයා වෙත පැවරේ . අධිකරණයේ නඩුවකට යොමු විය හැකි සෑම සැක සහිත මරණයක් ම, රිය අනතුරක් නිසා සිදුවන මරණ මෙන් ම, නිශ්චිත හේතුව සොයා ගැනීමට නොහැකි මරණ හා අමාත්‍යාංශ චක්‍රලේඛ මගින් පෙන්වා දී ඇති අනිවාර්යයෙන්ම පශ්චාත් මරණ

පරීක්ෂණයක් සඳහා යොමු කළ යුතු මරණ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු වෙත යොමු කිරීම අනිවාර්ය වේ.

**5.18.** රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙන ලද B18 ආකෘතිය සෑම හදිසි මරණ පරීක්ෂණයක් සඳහාම භාවිත කළ යුතු අතර එහි මුල් පිටපත මරණය ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් වෙත ලබා දීමට හැකි වන පරිදි ඥාතීන්ටත්, දෙවන පිටපත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාටත්, භාර දිය යුතු අතර තමා විසින් හෝ තම පූර්වගාමියෙකු විසින් නිකුත් කරන ලද බී 18 ආකෘතිය සංශෝධනයක් සිදු කිරීමට අවශ්‍ය අවස්ථාවක දී ඒ පිළිබඳව ලිඛිත ඉල්ලීමක් දෙවන පිටපත් භාර අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු අතර සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව එම ලේඛනය විධිමත් පරිදි නැවත භාරදීම සඳහා කටයුතු කළ යුතු වේ.

**5.19.** රෝහලකට ඇතුළත් කිරීමෙන් පසුව හෝ රෝහල වෙත රැගෙන ඒමෙන් අනතුරුව තහවුරු කරන මරණ පිළිබඳව එම රෝහලට පත් කොට ඇති හදිසි මරණ පරීක්ෂකවරයෙකු සිටී නම් ඔහු විසින්ද, එසේ නොමැති නම් එකී රෝහල අයත්වන බල ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක විසින්ද සිදුකල යුතු ය.

**5.20.** යම් හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයක් තුළ යම් මරණයක් සිදුවී ඒ පිළිබඳව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා රෝහලකට යොමු කරන්නේ නම් එම මරණය සිදුවූ ස්ථානයට අදාළ හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසයේ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් හදිසි මරණ පරීක්ෂණය පැවැත්විය යුතු ය.

**5.21.** මාතෘ මරණ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2014 හා 13/2018 හි සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

**5.22.** සෑම මරණ පරීක්ෂණයක් ම අවසන් කළ වහාම අදාළ වාර්තාව මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**5.23.** මීට අමතරව අමාත්‍යාංශය විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, මාර්ගෝපදේශන හා උපදෙස්වලට අනුව රාජකාරි කටයුතුවල නිරතවිය යුතු ය.

**5.24.** හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා පත් කළ පසු එම රාජකාරිවලට අදාළව අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් හෝ අධිකරණ අමාත්‍යාංශයේ එකඟතාව මත රජයේ වෙනත් ආයතනයක් මඟින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන පාඨමාලා සඳහා අනිවාර්යෙන් සහභාගි විය යුතු ය.

**5.25.** යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ සේවය අවසන් වුවහොත් එම කොට්ඨාසය සඳහා අලුතෙන් පත්වන හදිසි මරණ පරීක්ෂකවරයා වෙත තමා භාරයේ ඇති සියලු ලේඛන භාරදිය යුතු ය. එසේම යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකු මියගිය හොත් එම කොට්ඨාසය සඳහා අලුතෙන් පත්වන හදිසි මරණ පරීක්ෂකවරයා විසින් අදාළ ලේඛන ලබා ගත යුතු ය.

**5.26.** යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකු මියගිය හොත් එම කොට්ඨාසය සඳහා පත් වන අනුප්‍රාප්තික හදිසි මරණ පරීක්ෂකවරයා විසින් අදාළ ලේඛන ළඟම ඥාතියා වෙතින් ලබා ගත යුතු ය.

**5.27.** වඩා විනිවිදභාව, නිර්වද්‍යතාව සහ ඒකාකාරිත්වය ආරක්ෂා කිරිම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන අකෘතිපත්‍ර භාවිතා කිරිම සිදු කල යුතු ය.

**5.28.** මරණ පරීක්ෂණ සිදුකරන අවස්ථාවක දී ඉදිරි අවශ්‍යතාවයන් සඳහා මෘත දේහය හා අවට සක්ෂි ලබා ගැනිම සම්බන්ධයෙන් ඡායාරූප ගත කිරිම, පටිගත කිරිම් සිදු කළ ද, අධිකරණමය නියෝගයකට හැර වෙනත් කිසිදු අවස්ථාවක දී එම ඡායාරූප, හඩ පටි මරණ පරීක්ෂණය සම්බන්ධ කිසිදු තොරතුරක් සමාජ මාධ්‍ය වෙත තෙවන පර්ශ්වයක් වෙත මුදා හැරිම / ලබා දිම සිදු නොකළ යුතු ය.

## 6. විනය පාලනය.

**6.1.** හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ විනය බලධාරියා අධිකරණ විෂය පැවරී ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර ඔහු විසින් ලබා දෙන උපදෙස් හා නියෝග අනුව සේවය ලබා දිය යුතු ය.

**6.2.** 5 වන වගන්තිය යටතේ දක්වා ඇති වගකීම් හා කාර්යය භාරය හෝ අධිකරණ විෂය පැවැරී ඇති අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝග පැහැර හැරීමක් සම්බන්ධව හෝ තනතුර අව භාවිතය සහ අයුතු යොදා ගැනීමක් සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබෙන යම් පැමිණිල්ලක්, පෙත්සමක් හෝ තොරතුරක් මත ලේකම්වරයා මඟින් නම් කරනු ලබන රජයේ නිලධාරියෙකු මඟින් සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව (විමර්ශනය මාස 03ක් ඇතුලත අවසන් කළ යුතුය) අදාළ විමර්ශන නිලධාරියා විසින් නිර්දේශ කරනු ලබන විනය පියවර ලේකම්වරයාගේ තහවුරු කිරීම මත ගනු ලැබේ.

**6.3.** එම විමර්ශනයේදී එම චෝදනා සඳහා වැරදිකරුව සේවය අවසන් කිරීම සඳහා නිර්දේශ වුවහොත් ඕනෑම මොහොතක දී ලේකම්වරයා විසින් එකී නිර්දේශය තහවුරු කිරීමෙන් අනතුරුව ගරු අධිකරණ අමාත්‍යතුමාගේ එකඟතාව මත හදිසි මරණ පරීක්ෂක තනතුරෙහි පත්වීම අවලංගු කිරීම සිදු කරනු ලබයි.

**6.4.** මෙම කාර්යය සංග්‍රහයේ 6.3 පරිදි යම් හදිසි මරණ පරීක්ෂකවරයකු ඉවත් කළහොත් එසේ ඉවත් කරනු ලැබූ දින සිට එක් ලිත් මසක කාලයක් ඇතුළත අභියාචනා කිරීම කළ හැකිය.

## 7. හදිසි මරණ පරීක්ෂකවරයකුගේ පත් කිරීම අවලංගු කිරීම.

**7.1.** 4 වන වගන්තිය යටතේ පත්වීමේ වසර තුනක (03) කාලය ඉක්ම යාම.

**7.2.** යම් හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ වයස අවුරුදු හැත්තෑව 70 සම්පූර්ණ වීම.

**7.3.** හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් සිය තනතුරින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් ඉල්ලා අස්වීම.

**7.4.** හදිසි මරණ පරීක්ෂකවරයකුගේ පත්වීමට අදාළ 3 වන වගන්තිය යටතේ වන සුදුසුකම් හි සිදු වනු ලබන වෙනස් වීම.

**7.5.** විනය හේතූන් මත.

**7.6.** හදිසි මරණ පරීක්ෂණ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මට්ටමේ යහපත් සෞඛ්‍ය තත්වයක් නොමැති බවට වාර්තා වීම.

**7.7.** රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක / කොමිෂන් සභාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක තනතුරකට පත් වුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු වශයෙන් තේරී පත්වීම.

**7.8.** මෙම කාර්ය සංග්‍රහයේ 2,3,4,5 වගන්ති යටතේ දක්වා ඇති කරුණුවලට පටහැනිව කටයුතු කිරීම.

## 8. හදිසි මරණ පරීක්ෂක බලප්‍රදේශ.

**8.1.** ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සහ රෝහල් නියෝජනය වන පරිදි අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන බල ප්‍රදේශයන් හදිසි මරණ පරීක්ෂක බලප්‍රදේශ ලෙස සලකනු ලබයි.

9. <u>සේවයට වාර්තා කිරීම.</u>

**9.1.** සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් තම බල ප්‍රදේශයට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කල යුතු අතර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ විධිවිධානවලට යටත්ව රාජකාරී කටයුතු සිදු කළ යුතුය.

**9.2.** එසේම නියමිත අවස්ථාවේ සේවයට වාර්තා කිරීමට අපහසු වන්නේ නම් ඒ සඳහා වැඩ බැලීමට එම කොට්ඨාසයේ ම හෝ ආසන්නතම කොට්ඨාසයේ හදිසි මරණ පරීක්ෂකවරයා ඒ සඳහා නම් කරමින් ඒ පිළිබඳව අප්‍රමාදව අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කල යුතු ය.

10. <u>දේශීය හා විදේශ නිවාඩු.</u>

**10.1.** සතියේ දිනවල දී මෙන්ම රජයේ නිවාඩු දින හා සති අන්ත දිනවල දී ද, කාර්යාල වේලාවන් නොසලකා අවශ්‍යතාව පරිදි සේවය සැපයීමට සියලුම හදිසි මරණ පරීක්ෂකවරු බැඳී සිටිති. සති එකකට (01) වැඩි කාලයක් දේශීය හෝ විදේශ නිවාඩු ලබා ගැනීමට හදිසි මරණ පරීක්ෂකවරුන් අදහස් කරන්නේ නම් රාජකාරී ආවරණය සඳහා යාබද කොට්ඨාසයක හදිසි මරණ පරීක්ෂකවරයෙකුගේ නමක් ද සහිතව අදාළ ඉල්ලීම අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

11. <u>හදිසි මරණ පරීක්ෂකවරුන්ගේ නිල ඇඳුම.</u>

**11.1.** හදිසි මරණ පරීක්ෂණයකට සහභාගි වීමේ දී තනතුරේ ගරුත්වය ආරක්ෂා වන පරිදි සුදුසු නිල ඇඳුමකින් ඊට සහභාගි වීම බෙහෙවින් වැදගත් ය.

**11.2.** යුරෝපීය ඇඳුමෙන් සැරසී හදිසි මරණ පරීක්ෂණ කටයුතුවල නිරත වන හදිසි මරණ පරීක්ෂකවරුන් කළු පැහැති කලිසමක් සහ සුදු පැහැති කමිසයකින් සැරසී (ටයි පටියක් පැළඳීම) හෝ සුදු ජාතික ඇඳුමෙන් සැරසී රාජකාරියෙහි නිරතවීම යෝග්‍ය වේ.

**11.3.** කාන්තා හදිසි මරණ පරීක්ෂකවරින් සඳහා ඔසරිය / සාරිය අවස්ථානුකූලව සුදුසු ඇඳුමකින් සැරසී රාජකාරියේ නිරතවීම යෝග්‍ය වේ.

12. <u>නිවේදන</u>

**12.1.** හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් පහත දැක්වෙන යම් වෙනසක් ඇති විමෙන් පසුව හැකි ඉක්මනින් ඒ පිළිබඳව ලිඛිතව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය.

**12.1.1.** හදිසි මරණ පරීක්ෂකවරයාගේ නාමේ වෙනසක්

**12.1.2.** පදිංචි ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක්

**12.1.3.** සේවය අවසන් කිරීමට හදිසි මරණ පරීක්ෂකවරයාට ඇතිවන අවශ්‍යතාව

**12.2.** මරණය හෝ අයහපත් සෞඛ්‍ය තත්වය ඇතුළු හදිසි මරණ පරීක්ෂණ සේවයේ යෙදීම අපහසු වන කාරණා පැන නැගීමේ දී ඒ පිළිබඳව අදාළ ග්‍රාම නිළධාරිවරයා මඟින් ලිඛිතව අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීම සඳහා මරණ පරීක්ෂකවරයාගේ පවුලේ අය හෝ ඥාතින් හෝ වෙනත් සමීපතමයින්ව දැනුවත් කර තිබිය යුතුය.

**13. <u>අර්ථ නිරූපණ</u>**

I. කාර්ය සංග්‍රහය - යන්නෙන් මෙම කාර්යය සංග්‍රහය අදහස් වේ

II. අමාත්‍යාංශය - යන්නෙන් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රේඛිය අමාත්‍යාංශය අදහස් වේ.

III. මහාධිකරණය - යන්නේ හදිසි මරණ පරීක්ෂකවරයා සේවය සපයනු ලබන ප්‍රදේශය අයත්වන **මහාධිකරණය අයත් වේ.**

IV. ලේකම් - යන්නෙන් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රේඛිය අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.